WWW.OLEVELAPI.COM

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

ශෛවනෙරි	I, II
சைவநெறி	I, II
Saivanery	I, II

ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළුව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, දෙවන ප්‍රශ්නය ඇතුළු අනෙකුත් සෑම ප්‍රශ්නයක් සඳහා ම ලකුණු **10** බැගින් ද හිමි වේ.

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) වේද හඳුන්වනු ලබන වෙනත් නම් **දෙකක්** සඳහන් කරන්න.

(ii) දීපාවලී යන වචනයේ අර්ථය සඳහන් කරන්න.

(iii) අරුණගිරිනාදර් විසින් අගය කරනු ලැබූ ශ්‍රී ලංකාවේ පූජනීය ස්ථාන **දෙකක්** සඳහන් කරන්න.

(iv) ශිව බැතිමතුන්ට ආහාර දන් දීමේ සේවය කළ අය ලෙස පෙරියපුරාණම්හි සඳහන් කරනු ලබන පිරිමි බැතිමතුන් **දෙදෙනෙකුගේ** නම් සඳහන් කරන්න.

(v) සුවාමි විපුලානන්දර් විසින් රචනා කරන ලද ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.

(vi) දේවාලවල පවත්වන සිත්ත්‍රා පෞර්ණමී විශේෂ වන්දනාවලදී සිදුවන ප්‍රධාන සිදුවීම් **දෙකක්** සඳහන් කරන්න.

(vii) "පිං කිරීමට මහ ධනය අවශ්‍ය නොවේ, සරල ක්‍රමවේද ප්‍රමාණවත් වේ" යන්නට තිරුමූලර් සඳහන් කරන උදාහරණ **දෙකක්** ලියන්න.

(viii) පොළොන්නරුව යුගයට අයත් සිංහල රජවරුන් විසින් පිහිටුවන ලද ශිව දේවාල **දෙකක්** නම් කරන්න.

(ix) උමාපති සිවාචාරියාර් සිදු කළ ආශ්චර්යයන් **දෙකක්** සඳහන් කරන්න.

(x) පෙරියපුරාණ කාව්‍යයේ තිරුක්කූට්ට විශේෂත්වයේ දැක්වෙන "කේඩුම් ආක්කමුම් කෙට්ට තිරුවිනාර්" යන ගීත පදයේ තේරුම කුමක් ද?

2. (i) පහත සඳහන් ගීතිකා අතුරෙන් **දෙකක්** නිවැරදිව හා නියමිත අනුපිළිවෙළට ලියන්න.

(අ) "කුනිත්ත පුරුවමුම්..."

(ආ) "පාල් නිනෛන්දූට්ටුම්..."

(ඉ) "විනායහනේ වෙව්විනෛයෛ..."

(ඊ) "මූවිරු මුහංගල්..."

(උ) "තනම් තරුම් කැල්වි තරුම්..."

(ii) ඉහත (i) හි ලියන ලද ගීතිකාවල අදහස ලියන්න.

3. "ඉන්බමේ එන්නාලුම් දුන්බමිල්ලෛ"

– තිරුනාවුක්කරසර් –

(i) දන් දීම, සමානත්වය යන ශෛව සදාචාර දහම් ගුණාංග සමඟ පිළිවෙළින් සම්බන්ධ වන ආකරයට තිරුනාවුක්කරසර්ගේ ආශ්චර්යයන් **දෙකක්** ලියන්න.

(ii) තිරුනාවුක්කරසර්තුමාට පෙර ආගමිකයන් සිදු කළ කෲර ක්‍රියා **තුනක්** හා ඒවායින් මිදීමට ඔහු විසින් ගායනා කරන ලද ගීතිකා (පදිහංගල්) **තුනක්** සඳහන් කරන්න (පදිහම්වල මුල් පද පේළි පමණක්).

(iii) තිරුනාවුක්කරසර්තුමාගේ ජීවිතයේ සිදුවූ 'කෛලාස තරිසනම්' පිළිබඳ තොරතුරු කෙටියෙන් පැහැදිලි කරන්න.

[හරයැති පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

4. "කුණංගර් ඊණ්ඩිය කළත්තිඩෙ නණුහියේ කුමරන් තාළ්
වණංගි මුම්මුරෙ පුහළ්න්දනර්"

– කන්දපුරාණම් මීට්සිප්පඩලම් –

(i) මීට්සිප්පඩලම් යන නම ඇතිවීමට හේතුව කෙටියෙන් සඳහන් කරන්න.

(ii) කන්දපුරාණම්වල එන කාණ්ඩම් අතුරෙන් **තුනක්** නම් කරන්න.

(iii) මුරුග දෙවියන්ගේ උපවාස අතුරෙන් **එකක්** පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

5. "තන්නිලමෙ මන්නුයිර්හල් සාරත් තරුම් ශක්ති
පින්නමිලාන් එංගල් පිරාන්"

– තිරුවරුට්පයන් –

(i) පතිගේ තිබෙන ආකාර **දෙක** කුමක් ද?

(ii) **පති** වෙත ළඟා වීමට ආත්මයන්හට ඉඩ නොදෙන අහංකාරයේ ගුණාංග (ආනවම්) **තුනක්** සඳහන් කරන්න.

(iii) ආත්ම විමුක්තිය සඳහා වූ ක්‍රමවේද ලෙස සෛවසිද්ධාන්තම්හි සඳහන් වන සෛවනාට්පාදංගල් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

6. "ශ්‍රී ලංකාවේ ජන ආගමික සම්ප්‍රදායේ පිරිමි සහ ගැහැණු දෙවිවරුන් අද්විතීය චාරිත්‍ර අනුගමනය කරමින් වන්දනාමාන කරනු ලැබේ."

(i) ජන වන්දනා සම්ප්‍රදායේ දක්නට ලැබෙන පුරුෂ දෙවිවරුන් **දෙදෙනෙකු** නම් කරන්න.

(ii) ජන ආගමික සම්ප්‍රදායේ පරාශක්තිගේ ලක්ෂණයක් ලෙස කණ්ණගිව නිරූපණය කරන ශ්‍රී ලංකාවේ සාහිත්‍යයන් **තුනක්** සඳහන් කරන්න.

(iii) කණ්ණගි මෑණියන්ට අයත් චාරිත්‍රවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

7. පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) විවාහ චාරිත්‍ර

(ii) තිරුකේදීච්චරම්

(iii) ශෛව ආගමික ජීවිතය

(iv) උත්සවය (මහෝත්සවම්)

* * *

WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...